## කොළඹ විශ්ව විද්‍යාලය - ශ්‍රී ලංකාව

### ශාස්ත්‍ර පීඨය

### ශාස්ත්‍රවේදී තුන්වන වසර පරීක්ෂණය - ප්‍රථම සෙමෙස්තරය - 2016 /2017

### SOC 3168 – සමාජ කාර්යවේදී න්‍යාය සහ ක්‍රම

පැ දෙකයි (02)

**ප්‍රශ්න තුනකට (03) පමණක් පිළිතුරු සපයන්න.**

**විභාග කාලය තුළ ක්ෂේත්‍ර සටහන් පොත පරිශීලනය සඳහා අවසර ලැබේ.**

---

1. ආරම්භයේදී ව්‍යුහාත්මක සමාජ කාර්යවේදයේ මූලික අරමුණ වූයේ ලිබරල් ධනවාදයේ වින්දිතයන්ට ප්‍රායෝගික, මානවහිතවාදී රැකවරණයක් සැපයීමත්, සමාජවාදී මාවතක් ඔස්සේ සමාජය ප්‍රතිව්‍යුහගත කිරීමත්ය. ඉහත ප්‍රකාශය බොබ් මුලලිගේ අදහස් ඇසුරෙන් විභාග කරන්න.

2. සමාජ කාර්යවේදයේ ප්‍රබලතා පර්යාලෝකය (strengths perspective) සහ ගැටලු මූලික ප්‍රවේශය (problem – based approach) අතර පවතින ප්‍රධාන වෙනස්කම් පැහැදිලි කරන්න.

3. <u>එක්කෝ</u>

   පශ්චාත් නූතනවාදී පර්යාලෝකය සමාජකාර්යවේදී භාවිතාව සඳහා මඟ පෙන්වන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න.

   <u>නැතහොත්</u>

   සමාජකාර්යවේදී භාවිතාවේ ආකෘතියක් ලෙස පද්ධති එළඹුම විවේචනාත්මකව අගයන්න.

4. ඔබගේ ප්‍රායෝගික පුහුණු ස්ථාපනයේදී සාර්ථකව යොදාගත හැකි සමාජ කාර්යවේදී විධික්‍රමයක් කෙරෙහි අවධානය යොමු කරමින් ආයතන ගතවූ වැඩිහිටියන්ගේ ජීවිතවල යම් වෙනසක් ඇති කිරීමට උත්සාහ දැරීමේදී සමාජ කාර්යවේදයේ කාර්යභාරය විවේචනාත්මකව සාකච්ඡා කරන්න.

*අ.පි.බ.*

5. ආබාධ සහිත පුද්ගලයන් මුහුණ දෙන අක්‍රිය කිරීමේ තත්ත්වයන් ඔවුන්ගේ භෞතවේදීය හෝ බුද්ධිමය වෙනස්කම් වලින් මතුවන ඒවාට වඩා සමාජ සහ සංස්කෘතික වශයෙන් නිර්මාණය කළ ඒවා වෙයි. මෙම ප්‍රකාශය විවේචනාත්මකව විමසන්න.

6. පහත සඳහන් ඕනෑම මාතෘකා **දෙකක් (02)** පිළිබඳ කෙටි රචනා ලියන්න.

   i. පරිහාරයට එරෙහි (anti – discriminatory) සහ පීඩාවට එරෙහි (anti – oppressive) පර්යාලෝක
   ii. රැකවරණ කළමනාකරණය (care management)
   iii. සමාජ කාර්යවේදය සඳහා මනෝ විශ්ලේෂණ එළඹුම
   iv. අන්තර් ආංශයිකභාවය

**************